මගේ අංකය : JSC/SEC/CIR – L/2023

<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : **07/2023**</u>

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ අතිරේක මහේස්ත්‍රාත්වරුන් වෙත,

<u>මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය සඳහා කාන්තාවන් යොමු කිරීම</u>

ශීර්ෂගත කාරණය හා සබැඳිව සමාජ සේවා අධ්‍යක්ෂ අනෝජා හේරත් මහත්මිය විසින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලදුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(නීති) පියුමන්ති පීරිස් මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2022.03.17 දිනැති ලිපියක් පිලිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 අප්‍රේල් මස 04 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

(15) 3048
NORMAL POST
සමාජ සේවා දෙපාර්තමේන්තුව
சமூக சேவைகள் திணைக்களம்
**DEPARTMENT OF SOCIAL SERVICES**
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சகம்
**Ministry of Women, Child Affairs and Social Empowerment**

"2030 වන විට ආන්තිකරණයට හා අවාසිසහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය සපිරි සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ පුරෝගාමියා"
"2030 ஆம் ஆண்டளவில் ஓரங்கட்டப்பட்ட மற்றும் பின்தள்ளப்பட்ட சமுதாயத்தின் உரிமைகள் மற்றும் சமத்துவம் நிரம்பப் பெற்ற பாதுகாப்பான இலங்கையொன்றை உருவாக்குவதில் முன்னோடியாக விளங்குதல் "
"To be the forerunner of the creation of a secured Sri Lanka with marginalized & disadvantaged People whose equality and rights to be protected by 2030"

මගේ අංකය / எனது இல. / My No. SSD/04/ 12/ 02/ 02
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022.03. 17

ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
නො : 19
ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10

**<u>මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය සඳහා කාන්තාවන් යොමු කිරීම</u>**

දෙමාපිය, භාරකරුවන් අහිමි දිවයින පුරා විසිරී සිටින ආබාධිත කාන්තාවනට රැකවරණය ලබා දෙමින් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අරමුණින් මනුසත් පියස බටුගම්මන රියන්සි අලගියවන්න කාන්තා රැකවරණ මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කරන ලදී.

02. එම මධ්‍යස්ථානය සඳහා වයස අවුරුදු 16-60 අතර දෙමාපියන්/ භාරකරුවන්ගේ රැකවරණය අහිමි ආබාධ සහිත කාන්තාවන් පමණක් ඇතුලත් කරගනු ලබයි.

03 ඒ අනුව අධිකරණ නියෝග මත වැරදිකරුවන් වූ කාන්තාවන්ට මෙම ආයතනයේ රැකවරණය ලබාදීම සඳහා හැකියාවක් නොමැති බව දන්වා සිටින අතර ඔවුන් මෙම ආයතනයට යොමු කිරීමට කරනු ලබන විමසීම් සඳහා අවස්ථා ලබාදීමේ හැකියාවක් නොමැති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

අනෝජා හේරත්
සමාජ සේවා අධ්‍යක්ෂ

02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 02 ஆம் மாடி, கட்டம் »», செத்சிறிபாய, பத்தரமுல்லை. 02nd Floor, Stage II, Sethsiripaya, Battaramulla.
කාර්යාලය 011 187050
ෆැක්ස් / தொலைநகல் 011 2186276
ඊ-මේල් / மின்னஞ்சல் dirssdss@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் www.socialservices.gov.lk